බප/හො/මොරගහහේන මහා විද්‍යාලය

පළමු වාර පරීක්ෂණය - 2023

6 ශ්‍රේණිය - ඉතිහාසය

නම/විභාග අංකය : ............................................... කාලය පැය 02 යි.

**I කොටස**

❖ **අංක 1 - 20 දක්වා ප්‍රශ්න වලට වඩාත් සුදුසු පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01) ඉතිහාසය ගැන අපට දැනුම ලබා ගැනීමට උපයෝගී වන සෑම දෙයක්ම හඳුන්වන්නේ

(i) ජනකතා ය. (ii) මූලාශ්‍රය. (iii) බණ පොත් ය. (iv) අට්ඨකතා ය.

02) පැරණි කාලයට අයත් භාණ්ඩ,ගොඩනැගිලි සහ ඒවායේ සුන්බුන් ආදී දේ හඳුන්වන්නේ,

(i) මූලාශ්‍රය. (ii) සෙල් ලිපි යනුවෙනි.

(iii) නටඹුන් යනුවෙනි. (iv) පුරා විද්‍යාත්මක සාධක යනුවෙනි.

03) දීපවංසය යනු,

(i) පුරා විද්‍යාත්මක මූලාශ්‍රයකි. (ii) සාහිත්‍ය මූලාශ්‍රයකි.

(iii) නටඹුන් වර්ගයකි. (iv) සෙල් ලිපි වර්ගයකි.

04)පොළොන්නරුවේ ගල් විහාරය ඉදි කළේ,

(i) පළමු වන විජයබාහු රජු ය. (ii) දුටුගැමුණු රජු ය.

(iii) වසභ රජු ය. (iv) පළමු වන පරාක්‍රමබාහු රජු ය.

05) දික්සඳ සෙනෙවියා පිරිවෙන්වාසී මහනාම හිමි රචනා කරන ලද සාහිත්‍ය කෘතිය වන්නේ,

(i) මහාවංසය යි. (ii) දීපවංසය යි.

(iii) ලෝවැඩ සඟරාව යි. (iv) ථූපවංසය යි.

06) ක්‍රිස්තු වර්ෂ යනුවෙන් භාවිත වන්නේ,

(i) ක්‍රිස්තුස් වහන්සේගේ උත්පත්තියෙන් පසු කාලය යි.

(iii) ක්‍රිස්තුස් වහන්සේගේ උත්පත්තියට පෙර කාලය යි.

(iii) ක්‍රිස්තුස් වහන්සේ ස්වර්ගස්ථ වූ දිනය යි.

(iv) ක්‍රිස්තුස් වහන්සේව කුරුසයට ඇණ ගැසූ දිනය යි.

07) මිහිඳු මහ රහතන් වහන්සේ මෙරට ට වැඩම කළේ,

(i) ක්‍රි. ව. 250 කට පෙර ය. (ii) ක්‍රි. පූ. 250 කට පෙර ය.

(iii) බු. ව. 250 කට පෙර ය. (iv) ශක වර්ෂ 250 කට පෙර ය.

08) ක්‍රමානුකූලව පොළොව හාරා අතීතය ගැන තොරතුරු සොයා බැලීම හඳුන්වන්නේ,

(i) පුරාවිද්‍යාත්මක කැණීම් ය. (ii) ශිලා ලිපි සොයා ගැනීම ය.

(iii) පුරා විද්‍යාව ය. (iv) ඓතිහාසික සාධක සොයා ගැනීම ය.

09) පොළොවේ යටම ඇති පස් තට්ටුවල තැන්පත් වී ඇත්තේ,

(i) වඩාත් පැරණි දේවල් ය. (ii) මෑත කාල වලට අයත් දේවල් ය.

(iii) පුරා විද්‍යාත්මක නටබුන් ය. (iv) ඓතිහාසික මූලාශ්‍රය.

10) ලෝකයේ මුලින් ම ජීවීන් බිහි වී ඇත්තේ,

(i) පසේ ය. (ii) ජලයේ ය.

(iii) අභ්‍යවකාශයේ ය. (iv) වනාන්තරවල ය.

11) ගිනි කඳු පිපිරෙන විට ඉන් පිටතට ගලා එන්නේ,

(i) අඟුරු ය. (ii) දූවිලි ය.

(iii) ගින්දර ය. (iv) ලාවා ය.

12) පෘථිවියේ මැමත් අලි ජීවත් වූයේ,

(i) මහා හිම යුගයේ ය. (ii) සිලුරියන් යුගයේ ය.

(iii) මධ්‍ය ශිලා යුගයේ ය. (iv) පැලියෝසොයික යුගයේ ය.

13) මිනිසෙකු වීමට නැඹුරුවක් ඇති කළ පැරණිතම මානවයා වන්නේ,

(i) හෝමෝ ඉරෙක්ටස් ය. (ii) හෝමෝ හැබිලස් ය.

(iii) ඔස්ට්‍රලොපිතිකස් ය. (iv) හෝමෝ සේපියන් ය.

14) " හැකි මිනිසා " ලෙස හඳුන්වන්නේ,

(i) හෝමෝ නියැන්ඩතාලන්සිස් (ii) ඔස්ට්‍රලොපිතිකස්

(iii) හෝමෝ හැබිලස් (iv) හෝමෝ ඉරෙක්ටස්

15) පෘථිවි අභ්‍යන්තරයේ උෂ්ණත්වය වන්නේ,

(i) 60 000 $C^0$ කි. (ii) 600 $C^0$ කි.

(iii) 6600 $C^0$ කි. (iv) 6000 $C^0$ කි.

16) ඔපබිනියෙකුගේ ලක්ෂණයක් නොවන්නේ,

(i) මුහුදු පතුලේ ජීවත් වීම. (ii) සෙ.මී. 4 - 7 අතර දිගය වේ.

(iii) මුඛයක් හා ඇස් 05ක් තිබීම. (iv) ඇසට නොපෙනෙන තරම් කුඩා වීම.

17) මානව පරිණාමය ලෙස හඳුන්වන්නේ,

(i) මහා හිම යුගයේ මිනිසුන් බිහි වීමේ ක්‍රියාවලිය යි.

(iii) චිම්පන්සියෙකුගෙන් සතුන් බිහි වීමයි.

(iii) ඔපබිනියෙකුගෙන් සතුන් බිහි වීමයි.

(iv) පෘථිවියේ ජීවීන් බිහි වීමේ ක්‍රියාවලිය යි.

18) නව ශිලා යුගයේ දී සිදුවු වැදගත් සිදුවීමකි.

(i) දුප්පත් පොහොසත් භේදය ඇතිවීම.

(iii) දුනු ඊතල භාවිත කිරීම

(iii) ගස් වල ගෙඩි ආහාරයට ගැනීම

(iv) වර්ණ යොදා ගල් පර්වත මත චිත්‍ර ඇඳීම

19) තමන්ගේ මලගිය නෑදැයින් වෙනුවෙන් අවමංගල්‍ය චාරිත්‍ර කිරීමට මිනිසුන් හුරු පුරුදු වූයේ,

(i) නව ශිලා යුගයේ දී ය. (ii) මධ්‍ය ශිලා යුගයේ දී ය.

(iii) පුරා ශිලා යුගයේ දී ය. (iv) හොලෝසීන යුගයේ දී ය.

20) සතුන්ගේ ඇටකටු භාවිතා කර නිවාස ඉදි කළේ කුමන මානවයාද?

(i) ඔස්ට්‍රලොපිතිකස් (ii) හෝමෝ සාපියන් ය.

(iii) හෝමෝ ඉරෙක්ටස් (iv) හෝමෝ නියැන්ඩතාලන්සිස් ය.